



මැතිවරණ සහ මැතිවරණ ප්‍රචාරක කටයුතු පිළිබඳ MAS ප්‍රතිපත්තිය

1. අරමුණ

1.1 MAS ආයතනය විසින් සිය සේවා නියුක්තියන් හට රටේ නීතියට අනුකූලව මහජන ආයතනවල රාජ්‍ය නිලතල දැරීම (උදා: ජනාධිපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, පළාත් සභා මන්ත්‍රී හෝ ඕනෑම ප්‍රාදේශීය සභාවක සාමාජිකයකු ලෙස), මැතිවරණ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අපක්ෂපාතී ලෙස සහභාගී වීමද ඇතුලත්ව, ආයතනයේ වටිනාකම් සුරකින පරිසරයක් ප්‍රවර්ධන කිරීමට බැඳී සිටියි.

1.2 MAS ආයතනය විසින් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට සහ සියලු ජනතාවගේ අභිලාෂයන් පිළිබිඹු කරන බහු නියෝජන ක්‍රමයන්ට සහාය දක්වයි. එබැවින් අප ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශවලට සහය වන අතරම අපේ සේවා නියුක්තියන්ව ඔවුන්ගේ තේරීම මත පදනම්ව සිය ජන්ද බලය භාවිතා කිරීම සඳහා දිරිමත් කරන්නෙමු.

1.3 කෙසේ නමුත්, දිගින් දිගටම මධ්‍යස්ථභාවය පවත්වාගෙන ගිය නිර්පාක්ෂික ආයතනයක් ලෙස, අපේ සියලුම සේවා නියුක්තියන් විසින් අපගේ වටිනාකම්වලට ගරු කරනු ඇති බවත්, ඔවුන් විසින් ව්‍යවස්ථානුකූලව හෝ අදාල නීතිමය විධිවිධානවලට අනුකූලව කලින් කලට පවත්වනු ලබන ඉහත සඳහන් ආකාරයේ මැතිවරණවලදීද මෙම වටිනාකම් උල්ලංඝනය කෙරෙන ඕනෑම ආකාරයක ක්‍රියාවකින් වැළකී සිටිනු ඇති බවත් අපි අපේක්ෂා කරන්නෙමු.

1.4 මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය, මහජන ආයතනවල රාජ්‍ය නිලතල සඳහා තරග කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන්ට සහ දැනටමත් තේරී පත්වී ඇති පුද්ගලයින් හට මාර්ගෝපදේශයක් වනු ඇති අතර එමගින් ඔවුන් අප ආයතනයේ වටිනාකම් සහ ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කිරීම සහතික කරනු ලැබේ.

2.0 විෂය පථය

2.1 මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය ශ්‍රී ලංකාවේ සිටින සියලුම MAS සේවා නියුක්තියන් සඳහා අදාළ වේ.

3.0 මැතිවරණ අපේක්ෂකයන් සහ එවැනි අපේක්ෂකයන් වෙනුවෙන් ප්‍රචාරණ කටයුතු කිරීමට බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයන් සඳහා වන මාර්ගෝපදේශ:

3.1 මහජන ආයතනවලට තරග කිරීමට බලාපොරොත්තුවෙන් සිටින සේවා නියුක්තියන් විසින් නාම යෝජනා භාරදීමට ප්‍රථම ඒ පිළිබඳව සේවායෝජක ආයතනයේ මානව සම්පත් ප්‍රධානියාට සහ තමා විසින් සේවයට වාර්තා කරන කළමණාකරුට ලිඛිතව දැනුම් දීම අවශ්‍ය වේ. එවිට සේවා නියුක්තියා වෙත තමා විසින් පිළිපැදිය යුතු ප්‍රතිපත්තිමය බැඳීම් පිළිබඳව දැනුවත් කෙරෙනු ඇත. මෙමගින් යම් සේවා නියුක්තියකු මහජන ආයතන සඳහා තරග කිරීමට තීරණය කරන්නේ නම්, ඔහු/ඇය විසින් පිළිපැදිය යුතු ප්‍රතිපත්ති පිළිබඳව ඔවුන් සම්පූර්ණයෙන්ම දැනුවත් බව සහතික කෙරේ. දෘෂ්‍යතාවය සහතික කිරීම සඳහා පසුව මෙය සමූහ ආයතනික සන්නිවේදන අංශයටද දන්වනු ලැබේ.

3.2 මැතිවරණ ව්‍යාපාරය අතරතුර හෝ ඉන්පසුව, තරග කරන සේවා නියුක්තියන්ගෙන් රැකියා කොන්ත්‍රාත්තුවට අනුකූලව බලාපොරොත්තු වන වගකීම් සහ රාජකාරී පිළිබඳව ඔවුන් දැනුවත් විය යුතුය. මෙහිදී අනෙකුත් කාරණා අතර ආයතනයේ ප්‍රතිපත්ති සහ අභිලාෂයන්ට පටහැනිවීම සම්බන්ධයෙන් ඇති ප්‍රතිපත්ති ප්‍රකාශයේ විධිවිධාන කෙරෙහිද අවධානය යොමු කෙරේ.

3.3 සේවා නියුක්තියන් ආයතන පරිශ්‍රය තුළ, ආයතනයේ සාද සහ ආයතනය විසින් සංවිධානය කරනු ලබන උත්සවවලදී හෝ ආයතනය නියෝජනය කරන අවස්ථාවලදී මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කිරීමෙන් වැළකී සිටිය යුතුය.

3.4 මැතිවරණ ප්‍රචාරක කටයුතුවලදී ආයතනයේ නම සහ සම්පත් සහ සේවා නියුක්ති විස්තර භාවිතා කිරීම සපුරා තහනම් වේ.

3.5 සේවා නියුක්තියන් විසින් මැතිවරණයට තරග කරන හෝ මැතිවරණ ප්‍රචාරණ වැඩ කටයුතු සඳහා සහභාගී වන හෝ, කිසියම් දේශපාලන අපේක්ෂකයෙකුට සහය දක්වන අවස්ථාවකදී, එම මැතිවරණ කටයුතු සඳහා ඔවුන්ගේ MAS සේවා නියුක්තිය සෘජුව හෝ වක්‍රව (උදා: ප්‍රචාරක රැස්වීම් හෝ කටයුතුවලදී MAS කමිස ඇඳීම) භාවිතා කිරීම සපුරා තහනම් වේ. මෙම තහනම පාලිත නොවන ආයතන, සැපයුම්කරුවන්, සහ අලෙවිකරුවන් ද ඇතුළුව MAS හා සම්බන්ධ සියලුම ආයතන සඳහා අදාළ වේ.

මෙම ලේඛනය MAS සතු වන අතර, එහි ඇතුළත් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුගත වන ලෙස සියලුම පුද්ගලයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

MAS

3.6 සේවා නියුක්තියන් මැතිවරණ ව්‍යාපාරවලට හෝ ඕනෑම අපේක්ෂකයකු හට සහය දැක්වීම සඳහා MAS සම්පත්, සබඳතා සහ ඩිජිටල් වේදිකා භාවිතා කිරීම සපුරා තහනම් වේ.

3.7 මැතිවරණ කටයුතු සඳහා විශේෂ නිවාඩු ලබා නොදේ.

3.8 සේවා නියුක්තියන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් යනාදී ආයතනයේ කිසිදු පාර්ශවකරුවෙකු හරහා මැතිවරණ ව්‍යාපාර සඳහා අරමුදල් රැස් කිරීම තහනම් වේ.

3.9 තරග වදින සේවා නියුක්තියන් විසින් වෙනත් කිසිදු සේවා නියුක්තියෙකුව කිසිදු මැතිවරණ කටයුත්තක් සඳහාවත් සම්බන්ධ කර නොගත යුතු අතර එවැනි කටයුතු සඳහා ආයතනයේ උත්සව හෝ කිසිදු රැස්වීමක් භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය.

3.10 මැතිවරණ ව්‍යාපාරය අතරතුරදී සංවිධානය කරනු ලබන උත්සව අවස්ථා අතරතුරදී පවා, තමන්ගෙන් බලාපොරොත්තු වන අවංකභාවයෙන් සහ විනයකින් යුක්තව කටයුතු කළ යුතු බවත්, ආයතනයේ වටිනාකම්වලට හානි වන සහ ආයතනයේ ප්‍රතිරූපයට අපකීර්තියක් ඇති වන ආකාරයේ හැසිරීම් වලින් වැළකිය යුතු බවත්, සේවා නියුක්තියන්ව දැනුවත් කළ යුතුය.

3.11 සේවා නියුක්තියන් විසින් සිදු කරනු ලබන හෝ සහභාගී වන පොදු දේශපාලන ප්‍රචාරක රැස්වීම්වල අන්තර්ගතය නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා ඒවාට නියෝජිතයකු සහභාගි කරලීමේ අයිතිය MAS සතුය.

4,0 පළාත් පාලන ආයතන සඳහා තේරී පත්වූ සේවා නියුක්තියන් සඳහා වන මාර්ගෝපදේශ

4.1 පළාත් පාලන ආයතන වලට තේරී පත්වූ සේවා නියුක්තියන් විසින් අනෙකුත් සියලුම ආයතන ප්‍රතිපත්ති මෙන්ම MAS DNA චර්යාධර්ම සංග්‍රහයද දැඩි ලෙස පිළිපැදිය යුතුය.

5.0 ජනාධිපති, පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ නීතිය යටතේ තේරී පත්වූ සේවා නියුක්තියන් සඳහා වන මාර්ගෝපදේශ

5.1 මහජන ආයතනයක රාජ්‍ය නිලතල දරන අතරම රැකියා ගිවිසුමේ සඳහන් කොන්දේසි ප්‍රකාරව ආයතනය සමඟ එකඟ වූ පරිදි සේවා නියුක්තියාට ඔහුගේ/ඇයගේ වගකීම් ඉටු කිරීමට නොහැකි වනු ඇතැයි සළකා බලා, පළාත් පාලන ආයතනයක (මහ නගර සභාව, නගර සභාව, ප්‍රාදේශීය සභාව) මන්ත්‍රීවරයෙකු ලෙස හැර වෙනත් ඕනෑම ආකාරයක මහජන ආයතනයක් වෙත තේරී පත්වන ඕනෑම සේවා නියුක්තියෙකු, ආයතනයේ සියලුම සේවාවලින් ඉල්ලා අස්වීම අපේක්ෂා කෙරේ.


6.0 අනුකූල නොවීම් කළමනාකරණය කිරීම

6.1 සියලුම සේවා නියුක්තියන් විසින් ඉහත සඳහන් ප්‍රතිපත්ති දැඩිව පිළිපැදිය යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වීම ආයතන ප්‍රතිපත්ති සහ රැකියා ගිවිසුම කඩ කිරීමක් ලෙස සළකනු ලැබේ.

6.2 ඉහත ප්‍රතිපත්තිවලට අනුකූල නොවන අවස්ථා පිළිබඳ වාර්තා කිරීම ආයතනය විසින් දිරිමත් කරනු ලබයි.

6.3 සේවා නියුක්තියන් සංවිධානයේ අනෙක් සියලුම ප්‍රතිපත්තිවලටද දැඩි ලෙස අනුකූල වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

*මැතිවරණ කටයුතු යන්නෙන් මැතිවරණ ප්‍රචාරක කටයුතු (පෝස්ටර්ස් බෙදාගැනීම, සමාජ මාධ්‍යය ආදිය), කැන්වසින් යෑම, අරමුදල් රැස්කිරීම ද ඇතුලත්ව, නමුත් ඒවාට පමණක් සීමා නොවී මැතිවරණයකට සම්බන්ධ සියලුම කාරණා අදහස් කෙරේ.



මෙම ලේඛනය MAS සතු වන අතර, එහි ඇතුළත් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුගත වන ලෙස සියලුම පුද්ගලයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

MAS